දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )NCCP/GOSL/CPED/36/2024
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 11.07.2024
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம் அமைச்சு
# Ministry of Health

---

චක්‍ර ලේඛ අංක : 01 – 26 / 2024

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ආයතන ප්‍රධානී,
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

## ලෝක පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ මාසය - ඔක්තෝබර් 2024

ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේද කාන්තාවන් අතර සුලබතම පිළිකාව පියයුරු පිළිකාවයි. 2021 වර්ෂයේ ශ්‍රී ලංකීය ජාතික පිළිකා ලේඛනයට අනුව හඳුනාගත් කාන්තා පිළිකා අතුරින් 27% (5485) ප්‍රමාණයක් පියයුරු පිළිකා රෝගීන්වේ. පියයුරු පිළිකා සහිත පිරිමි රෝගීන් 124 දෙනෙක් ද හඳුනාගෙන ඇත. පසුගිය කාලය තුළ අළුතෙන් හඳුනා ගත් පියයුරු පිළිකා රෝගීන්ගේ සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වීමක් පෙන්නුම් කරයි.

පියයුරු පිළිකා ඇති රෝගීන් කල් ඇතිව හඳුනා ගැනීම, කඩිනම් රෝග විනිශ්චය, ප්‍රතිකාර ලබාදීම සහ පිළිකාව සමඟ දිවි ගෙවන රෝගීන් සඳහා ඇති නොයෙකුත් සේවාවන් පිළිබඳව ජනතාවගේ දැනුවත් බව වැඩි කිරීමේ අරමුණින් ලොව පුරා 'පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය' සෑම වසරකම ඔක්තෝබර් මාසයේදී සමරනු ලැබේ. පියයුරු පිළිකාව කලින් හඳුනාගෙන මූලික අවස්ථාවේදී ප්‍රතිකාර කිරීම මගින් රෝගය සුව කරගැනීමට ඇති හැකියාව වැඩි වේ.

පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීම සඳහා ඇති අවස්ථා,

- පියයුරුවල ඇතිවිය හැකි අසාමාන්‍යතා සම්බන්ධ රෝග ලක්ෂණ හා සළකුණු පිළිබඳ ජනතාවගේ දැනුම ඉහළ නැංවීම ('ඔබ විසින්, ඔබ වෙනුවෙන්') (ඇමුණුම I)
- ස්ව පියයුරු පරීක්ෂාව (SBE)
- සායනික පියයුරු පරීක්ෂාව (CBE)

දීප ව්‍යාප්ත සුවනාරී සායන හා සුවදිවි සායන මෙන්ම ඇතැම් ද්විතියික/තෘතියික රෝහල් තුළ පවත්වන 'පියයුරු සායන' මගින් පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීමේ සේවාව ලබා දේ (ඇමුණුම II). මෙය තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය වන මැමෝග්‍රැෆි (ඇමුණුම III) පරීක්ෂාව සහ ව්‍යාධිවේදී පරීක්ෂණ සඳහා අවශ්‍ය වන පහසුකම්ද රට පුරා ව්‍යාප්තව පවතී.

ජාතික පිළිකා මර්දන වැඩසටහන සෑමවිටම පියයුරු පිළිකාව කලින් හඳුනා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා බහු පාර්ශවකරුවන් සමඟ කටයුතු කරයි. මෙම වසර සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ඔක්තෝබර් මාසය පුරාවට යෙදෙන දැනුවත් කිරීමේ දීප ව්‍යාප්ත පා ගමන් මාලාවකි. බාහිර පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් මේ සඳහා විශේෂ සෞඛ්‍ය ප්‍රවර්ධන මෙවලම් සකස් කර ඇත.

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (RDHS), විශේෂඥ ප්‍රජා වෛද්‍යවරුන්, මාතෘ හා ළමා වෛද්‍ය නිලධාරීන් (MO/MCH), බෝ නොවන රෝග පිළිබඳ වෛද්‍ය නිලධාරීන් (MO/NCD) සහ ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් (RSPHNO) යන අයගේ සහයෝගය ඇතිව පහත සඳහන් ක්‍රියාකාරකම් ඔබේ ප්‍රදේශයේ සිදු කරන ලෙස දිවයින පුරා පිහිටි සියලුම රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (MOH) සහ ප්‍රාථමික වෛද්‍ය සේවා ආයතනභාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ඉල්ලා සිටී.

1. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හරහා එක් දිස්ත්‍රික්කයකට දැනුවත් කිරීමේ පාගමන් තුනක් බැගින් සංවිධානය කළ යුතුය. සෑම දිස්ත්‍රික්කයකම බෝ නොවන රෝග පිළිබඳ වෛද්‍ය නිලධාරීන් කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරන අතර දිස්ත්‍රික්කයේ සියලුම සෞඛ්‍ය ආයතන (රේඛීය අමාත්‍යාංශය සහ පළාත්) මෙම ක්‍රියාකාරකම සඳහා පූර්ණ සහයෝගය ලබා දිය යුතුය. සෑම දිස්ත්‍රික්කයකම පාගමන් පවත්වන දින පිළිබඳව ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත කලින් දැනුවත් කළ යුතුය. **අවම වශයෙන් එක් පාගමනකට 100 දෙනෙක්වත් සහභාගී වීම අනිවාර්ය වේ.** සෑම දිස්ත්‍රික්කයකම 300 දෙනෙක් සඳහා සංග්‍රහ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් අදාල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලබා දෙනු ලැබේ. සෞඛ්‍ය අංශයට සීමා නොකර දිස්ත්‍රික්කයේ බහු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය (රාජ්‍ය නොවන සංවිධාන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, පාසල් සහ අනෙකුත් රජයේ කාර්යාල ආදිය) බෝ නොවන රෝග පිළිබඳ වෛද්‍ය නිලධාරීන් විසින් සහතික කළ යුතුය. පාගමන් පිළිබඳව ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත්කර විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රචාරණය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2. ඔක්තෝබර් මාසය තුළ පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීම පිළිබඳ පණිවිඩ හුවා දැක්වීම සඳහා, රෝහල්වල බාහිර රෝගී අංශ හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් පවත්වනු ලබන සියළුම සායන ආදී හැකි සෑමතැනකම; රෝස පැහැති පටි, බැලූන් හෝ සුදුසු ආකර්ෂණීය සහ අඩු වියදම් සැරසිලි භාවිතා කරමින් අලංකාර කිරීම සුදුසුය. පියයුරු පිළිකාවෙන් සුව වූ අය හා මිය ගිය රෝගීන් සිහි කිරීමට මෙන්ම පියයුරු පිළිකාවෙන් ගැලවීම සඳහා දරණ උත්සාහයන් අගය කිරීම සඳහා අන්තර්ජාතිකව පිළිගෙන ඇති වර්ණය රෝස පැහැයයි. සිවිල් සමාජ සංවිධානවල සක්‍රිය සහභාගීත්වය තුළින් පෞද්ගලික අංශයට සහ රාජ්‍ය නොවන අංශයට මෙම මූලික ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකිය.

3. රෝහල් මට්ටමින් සහ සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශයකම පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීම පිළිබඳ පුහුණුකරුවන්ගේ වැඩසටහන් (TOT), දේශන සහ සාකච්ඡා වැඩසටහන් පැවැත්විය යුතුය. පියයුරු පිළිකා කල්තියා හඳුනා ගැනීම සඳහා සුවනාරි සායන, ‘සුව දිවි සායන’, ශල්‍ය සායන, පියයුරු සායන, පිළිකා කලින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන (CEDC) සහ ජංගම පිළිකා පරීක්ෂණ සායනවල, පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කළ යුතුය.

4. පියයුරු පිළිකා පිළිබඳ තොරතුරු සැපයීම සඳහා **'පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ ස්ථානයක්'** රෝහල්වල සහ අනෙකුත් සෞඛ්‍ය සේවා ආයතනවල පිහිටුවිය හැකිය. මෙහිදී, හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් (PHNO) හෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් වැනි සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩල, පියයුරු පිළිකා පිළිබඳ මහජනතාව අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමට අනුයුක්ත කළ හැක. එමෙන්ම අමතර තොරතුරු ලබා දීමට මේ සමග ජාතික පිළිකා මර්දන වැඩසටහන විසින් සපයා ඇති දැනුවත් කිරීමේ පත්‍රිකා භාවිතා කළ හැකිය.

5. ඔබ ආයතනයේ ෆේස්බුක්/ඉන්ස්ටග්‍රෑම්/වෙබ් පිටු භාවිතා කරමින් හා WhatsApp හෝ Viber කණ්ඩායම් හරහා පියයුරු පිළිකා කලින් හඳුනා ගැනීමේ පණිවිඩ සමාජ ජාල මාධ්‍ය මගින් ප්‍රචාරය කළ හැක. ඒ සඳහා ඔබට මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇති දත්ත භාවිතා කළ හැකිය.

ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් මේ වනවිටත් ලබා දී ඇති සෞඛ්‍ය අධ්‍යාපන/ ප්‍රවර්ධන මෙවලම් උදා: බැනර්, ස්ව පියයුරු පරීක්ෂාව ඉගැන්වීම සඳහා ඇති ඩමියන් (දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට ලබා දී ඇත්නම්), ස්ව පියයුරු පරීක්ෂාව පිළිබඳ සැණපත් කට්ටල සහ අත් පත්‍රිකා, දැනුවත් කිරීමේ කටයුතු සඳහා භාවිතා කළ හැක.

2024 ලෝක පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය (ඔක්තෝබර්), සැමරීම සඳහා ඔබේ ආයතනය දිස්ත්‍රික්කය විසින් සිදු කරන ලද විශේෂ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශ වාර්තාවක් 2024 නොවැම්බර් 15 වන දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත ඉදිරිපත් කරන ලෙස ඔබට උපදෙස් දෙනු ලැබේ. සාරාංශ වාර්තාව විද්‍යුත් තැපැල මගින් ද එවිය හැකිය: nccpmohsl@gmail.com

මෙම ජාතික ප්‍රයත්නය සඳහා ඔබගේ නායකත්වය, මග පෙන්වීම සහ ක්‍රියාකාරී සහභාගීත්වය බෙහෙවින් අගය කරමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය අසේල ගුණවර්ධන
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් :
1. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා
2. ගරු සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය
3. සියලුම පළාත් සෞඛ්‍ය අමාත්‍යතුමන්
4. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
5. අතිරේක ලේකම් (වෛද්‍ය සේවා/ මහජන සෞඛ්‍ය සේවා)
6. සියලුම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්
7. සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
8. අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩ සටහන, මාතෘ හා ළමා සෞඛ්‍ය කාර්යාංශය, බෝ නොවන රෝග අංශය, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඒකකය, ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය, පෞද්ගලික සෞඛ්‍ය සේවා සංවර්ධන